ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව
උපාධි වැඩසටහන 2023/2024
6 වන මට්ටම
අවසාන පරීක්ෂණය - 2024
**SNU6224/ESU4124-අධ්‍යාපන කළමනාකරණය**
කාලය- පැය තුනයි. (03)

---

දිනය - 2025.03.02 වේලාව -ප.ව.01.30 - ප.ව.04.30 දක්වා

---

1 වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.

<u>01 වන කොටස</u>

01. කළමනාකරණය යන්නෙන් අදහස් කරන්නේ කුමක්දැයි කෙටියෙන් විස්තර කර පාසල් පසුබිමෙන් ලබාගත් උදාහරණයක් මඟින් ඔබේ පිළිතුර පැහැදිලි කරන්න.

02. විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සඳහා ආමන්ත්‍රණය කිරීමට ගුරුවරුන්ට, අධ්‍යාපනික කළමනාකරණය අත්‍යවශ්‍ය වන්නේ ඇයිදැයි පැහැදිලි කරන්න.

03. "කාර්යක්ෂමතාව ඵලදායීතාවයට මඟ පාදයි" මෙම ප්‍රකාශය කෙටියෙන් සාකච්ඡා කර, ඔබේ පාසල් සන්දර්භයෙන් අදාළ උදාහරණයක් සපයන්න.

04. Henry Fayol විසින් හඳුන්වා දෙන ලද කළමනාකරණ කාණ්ඩ අතරින් පළමු කාණ්ඩ පහ (05) ලැයිස්තුගත කරන්න.

05. කලාප අධ්‍යාපන කාර්යාලයේ මූලික සංවර්ධනාත්මක වගකීම් පහක් (05) සඳහන් කරන්න.

06. පාසල් කළමනාකරණයට අදාළව විශේෂ අධ්‍යාපන ගුරුවරයකුගේ කළමනාකරණ ඉලක්ක පහක් (05) සඳහන් කරන්න.

07. කාර්යක්ෂම පාසලක ලක්ෂණ පහක් (05) ලැයිස්තුගත කරන්න.

08. පාසලක ඵලදායිතාවය කෙරෙහි විදුහල්පතිතුමාගේ ප්‍රධාන වගකීම් පහක් (05) සඳහන් කරන්න.

(ලකුණු 05x08=40)

## 02 - වන කොටස

09. (i.) කළමනාකරණ ක්‍රියාවලියේ ප්‍රධාන මූලිකාංග හතර **(04)** සඳහන් කරන්න. (ලකුණු 04)

(ii.) කළමනාකරණ ක්‍රියාවලියෙහි ඉතා වැදගත් අංගයක් ලෙස සැලසුම්කරණය සලකන්නේ ඇයි දැයි අදාළ උදාහරණ සහිතව විස්තර කරන්න. (ලකුණු 06)

(iii.) සැලසුම්කරණ ක්‍රියාවලියේ දී විදුහල්පතිවරුන් මුහුණ දෙන අභියෝග දෙකක් **(02)** හඳුනාගෙන එම අභියෝග විසඳීමට හෝ අවම කිරීමට ප්‍රායෝගික උපායමාර්ග යෝජනා කරන්න. (ලකුණු 10)

**10. "එෆ්.ඩබ්ලිව්. ටේලර්ගේ විද්‍යාත්මක කළමනාකරණ න්‍යාය මඟින් සංවිධානයක ඵලදායිතාව උපරිම කිරීම අවධාරණය කරයි."**

(i.) ඉහත න්‍යාය යටතේ ටේලර් විසින් සංවිධානයක ඵලදායිතාවය ඉහළ නැංවීම සඳහා ඉදිරිපත් කර ඇති මූලධර්ම ක්‍රියා පටිපාටින් හතරක් **(04)** සඳහන් කරන්න. (ලකුණු 04)

(ii.) ගුරුවරයකු ලෙස ඉහත සඳහන් කරන ලද මූලධර්ම/ ක්‍රියාපටිපාටින් අධ්‍යාපනික ප්‍රතිඵල ඉහළ නැංවීම සඳහා යොදා ගන්නේ කෙසේද? සුදුසු උදාහරණ දෙකක් **(02)** සපයමින් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii.) ටේලර්ට අනුව, වැඩ පරිසරය කෙරෙහි වැඩි සැලකිල්ලක් දැක්වීම සංවිධානයකට ඉතා වැදගත් වේ . ඔබේ පාසල තුළ වඩාත් හිතකර ඉගෙනුම් පරිසරයක් සංවිධානය කිරීම සඳහා ගුරුවරයෙකු ලෙස ඔබ ගන්නා ක්‍රියාමාර්ග මොනවාද? (ලකුණු 10)

11. 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පළාත් සභා පිහිටුවීමට සහ පරිපාලන වගකීම් ප්‍රාදේශීය මට්ටමට විමධ්‍යගත කිරීමට හේතු විය.

(i.) ශ්‍රී ලංකා අධ්‍යාපන ක්‍රමයේ වත්මන් අධ්‍යාපන කළමනාකරණ ව්‍යුහයේ ධූරාවලි මට්ටම් පහ **(05)** සඳහන් කරන්න. (ලකුණු 04)

(ii.) අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රධාන පරිපාලන ක්‍රියාවලීන් තුනක් **(03)** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06)

(iii.) පාසල් ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් ඉටු කරනු ලබන පරිපාලන භූමිකාවන් හතරක් **(04)** සුදුසු උදාහරණ භාවිතා කරමින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

12. "පන්ති කාමර පරිසරය තුළ සිසුන්ගේ අවශ්‍යතා ළඟාකරදීම සඳහා ගුරුවරුන් විසින් තීරණාත්මක භූමිකාවක් ඉටුකරයි."

(i.) විශේෂ අධ්‍යාපන ගුරුවරයකු වශයෙන් ඔබගේ පන්ති කාමරය ඵලදායි ලෙස සංවිධානය කර ගැනීම සඳහා විදුහල්පතිවරයාගෙන් ඔබ බලාපොරොත්තුවන ප්‍රධාන සහයෝගයන් දෙකක් **(02)** සඳහන් කරන්න. (ලකුණු 04)



37

(ii.) විශේෂ අධ්‍යාපන ගුරුවරයකු ලෙස ඵලදායි පන්ති කාමර කළමනාකරණයක් සහතික කිරීමට ඔබ විසින් අනිවාර්යයෙන් දැරිය යුතු අත්‍යවශ්‍ය වගකීම් තුනක් (03) කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06)

(iii.) ඉහත දෙක (02) කොටසෙහි සඳහන් වගකීම් දැරීමේදී ඔබට මුහුණ දීමට සිදු විය හැකි අභියෝග දෙකක් (02) හඳුනාගන්න. එම අභියෝග ජයගැනීමට හෝ අවම කිරීමට සුදුසු උපාය මාර්ග යෝජනා කරන්න. (ලකුණු 10)

13. "අධ්‍යාපන කළමනාකරණයේ ගැටලු විසඳීම සඳහා රජය විසින් විවිධ ක්‍රියාමාර්ග ගෙන තිබුනද එවැනි ගැටලු තවමත් පවතියි."

(i.) ශ්‍රී ලංකාවේ අධ්‍යාපන කළමනාකරණ පද්ධතිය තුළ සම්පත් කළමනාකරණයට අදාළ ප්‍රධාන ගැටලු **හතරක් (04)** හඳුනා ගන්න. (ලකුණු 04)

(ii.) 1 වන කොටසේ සඳහන් ගැටලු වලට මූලික හේතු සාධක කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii.) ගුරුවරයෙකු ලෙස මෙම ගැටලු විසඳීමට ඔබට දායක විය හැකි ආකාරය විස්තර කරන්න. (ලකුණු 10)

14. ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම අභ්‍යන්තර අධීක්ෂණ ක්‍රියාවලියේ මූලික අරමුණ වේ.

(i.) අභ්‍යන්තර අධීක්ෂණය යන සංකල්පය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii.) ගුරුවරුන්ට තම ඉගැන්වීම වැඩිදියුණු කර ගැනීම සඳහා අභ්‍යන්තර අධීක්ෂණයෙන් ලබා ගත හැකි ප්‍රතිලාභ, අදාළ උදාහරණ **තුනක් (03)** භාවිත කරමින් සාකච්ඡා කරන්න. (ලකුණු 06)

(iii.) අභ්‍යන්තර අධීක්ෂණය ක්‍රියාත්මක කිරීමේදී ඔබේ ආයතන ප්‍රධානියා /විදුහල්පති මුහුණ දෙන අභියෝග **දෙකක් (02)** හඳුනාගෙන ඒවා විසඳීමට හෝ අවම කිරීමට හැකි විසඳුම් යෝජනා කරන්න. (ලකුණු 10)

- සියලුම හිමිකම් ඇවිරිණි. -